**වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව (PASTORAL CONSTITUTION ON THE CHURCH IN THE MODERN WORLD - *GAUDIUM ET SPES*) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා එඬේරික ව්‍යවස්ථාවː ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්**

එස්. ඒ. පී. පී සිල්වා

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

හය වන පාවුළු පාප්තුමන්ගේ මූලිකත්වයෙන් ක්‍රි.ව. 1965 දී පැවති දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් සභාව ලෝකය තුළ යාවත්කාලීන කරනු වස් නිකුත් කරන ලද **වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නමැති එඬේරික ව්‍යවස්ථාව** ඉදිරිපත් කරන ලදී. එම ලේඛනය මගින් ශුද්ධ වූ සභාව පූර්ණ වශයෙන් ම ලෝකයට විවෘත වූ ආකාරය පිළිබඳව සොයා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි.

මෙහි මූලික පර්යේෂණ ගැටලු නම් වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නමැති එඬේරික ව්‍යවස්ථාව මගින් කතෝලික සභාව ලෝකයට විවෘත වූ ආකාරයත් එමෙන් ම සභාව තුළ තිබූ ඇතැම් ගැටලුකාරී තත්ත්වයන් මගහරවා ගෙන ආයතනික සභාව ව්‍යාප්ත කිරීමට එමගින් කොතෙක් දුරට කටයුතු කළේ ද යන්න විමසීම යි. මෙහි දී ප්‍රධාන වශයෙන් මෙම එඬේරික ව්‍යවස්ථාව පිළිබඳ ඇති වූ කතිකාවත් හා වාද විවාදයන් අධ්‍යයනය කිරීම අරභයා දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ විද්වතකු වන ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ ප්‍රාථමික මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිතයට ගෙන තිබේ.

මෙම එඬේරික ව්‍යවස්ථාව පිළිබඳ ව කතෝලික හා කතෝලික නොවන විද්වතුන්ගේ අදහස් ද මෙහි ඇතුළත් කර තිබේ. එමගින් මෙහි ඇති යහපත් ප්‍රවණතා මෙන් ම දුර්වලතා කවරේ ද යන්න පිළිබඳ ව ද අවධානය යොමු කෙරේ.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකි වේ. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද කරුණු ගොනු කොට තිබේ.

**මූලික පදː** මන්ත්‍රණ සභාව, විශ්ව ලේඛනය, ලෝකය